මානුෂීය සේවායතන සමූහය

මාර්තු 2010

# ක්ෂණික තතු විමසුම - (Rapid Context Assessment )

CONSORTIUM OF CHA HUMANITARIAN AGENCIES (GTE) LIMITED
ISO 9001 REGISTERED DNV MGMT.SYS. RvA C024 DNV Certification B.V., The Netherlands

## ජාතික විශ්ලේෂණය

| | |
|---|---|
| දේශපාලන සංදර්භය | 2 |
| පාලනය | 2 |
| මානව ආරක්ෂාව | 2 |
| මානව හිමිකම් | 3 |
| සිවිල් සමාජය හා මාධ්‍ය අවකාශය | 3 |
| ආර්ථික සංධර්භය | 4 |
| මානුෂීය සහ සංවර්ධන අවකාශය | 5 |
| පරිසරය | 5 |

## දිස්ත්‍රික්ක විශ්ලේෂණ

| | |
|---|---|
| අම්පාර | 5 |
| මඩකලපුව | 6 |
| කොළඹ | 6 |
| යාපනය | 6 |
| මන්නාරම | 6 |
| ත්‍රිකුණාමලය | 6 |
| වව්නියාව | 7 |

## ප්‍රවනතාවන් විශ්ලේෂණය කිරීම

| | |
|---|---|
| දේශපාලන සංදර්භය | → |
| පාලනය | ↓ |
| මානව ආරක්ෂාව | → |
| මානව හිමිකම් | → |
| සිවිල් සමාජය හා මාධ්‍ය අවකාශය | ↘ |
| ආර්ථික සංධර්භය | → |
| මානුෂීය සහ සංවර්ධන අවකාශය | ↓ |
| පරිසරය | → |

## සාරාංශය



Source Asia Tribune

අප්‍රියෙල් මස 08 වැනිදාට යෙදී ඇති පාර්ලිමේන්තු මහමැතිවරණය වෙත රටේ සම්පූර්ණ අවධානය යොමුවී ඇත. දැනට බලයේ සිටි එක්සත් ජනතා නිදහස් සංධානය මෙම මැතිවරණය ජයග්‍රහණය කර නව රජයක් පිහිටුවනු ඇතැයි විශ්වාස කෙරේ. මෙහිදී ප්‍රශ්නයට තුඩුදී ඇත්තේ දිනන්නේ කෙතරම් ප්‍රමාණයකින්ද යන්න පමණකි. රජය මහා පරිමාන වශයෙන් රාජ්‍ය දේපළ මැතිවරණ ව්‍යාපාරය සඳහා යොදා ගනිමින් සිටියි. විපක්ෂය දුර්මුඛ වී ඇත. මෙහිදී කැපී පෙනෙන තරගයක් ඇති වි තිබෙන්නේ එක්සත් ජනතා නිදහස් සංධානයේ අපේක්ෂකයින් අතරය. ඒ වැඩි මනාප සංඛ්‍යාවක් ලබා ගෙන පාර්ලිමේන්තු අසුන් ලබා ගැනීම සඳහාය.

උතුරු නැගෙනහිර පළාත් වල වැසියන්ට ඡන්දය ප්‍රකාශ කිරීම සඳහා රජය විසින් ප්‍රමාණවත් පහසුකම් සැලසූවේ නැතැයි යන්න අවධාරණය කරමින් මූලික අයිතිවාසිකම් පෙත්සම් ගණනාවක් අධිකරණය හමුවේ ගොනුකර ඇත. එසේම ජනාධිපති වරණයේදී රජයේ දේපළ අයථා අන්දමින් පරිහරණය කිරීම සම්බන්ධයේනද මෙවැනිම පෙත්සමක් ඉදිරිපත්වී ඇත.

රජය යහපාලනය සහ මානව හිමිකම් පිළබඳව වූ ජගත් ප්‍රතිපත්තීන් අනුගමනය කිරීමෙන් බැහැරව ක්‍රියාකිරීම නිසා රජය සහ අන්තර් ජාතික ප්‍රජාව අතර ගැටුමක් නිර්මාණය වී ඇත. ශ්‍රී ලංකාවේ මානව හිමිකම් පිළිබඳ තත්වයන් සොයාබලා වාර්තා කිරීමට එක්සත් ජාතීන්ගේ මහකොමසාරිස් වරයා විසින් අන්තර් ජාතික උපදේශක මංඩලයක් පිහිටුවීමට කටයුතු කිරීම එරෙහිව රජය දැඩි විරෝධත්වය පළ කර ඇත.

යුද්ධය අවසන්වීමත් සමගම මානව ආරක්ෂාවේ ඉහළ යාමක් දක්නට හැකිය. නමුත් සමාජයේ සමහර කොටස් තවමත් අවධානමට ලක්වී සිටි. උතුරු නැගෙනහිර පළාත් වලට යුද්ධය අවසන් වීමෙන් ලත් ප්‍රතිලාභ තවමත් සම්පූර්ණ වශයෙන් ලැබී නොමැත. අවතැන් වූවන්ට බලාපොරොත්තු වූ තරම් සහයෝගයක් ලැබී නොමැත. මෙම මැතිවරණයෙන් පසුව හෝ මෙම වැදගත් කරුනු පිළිබඳව සොයා බලනු ඇතැයි අපේක්ෂා කෙරේ.

පොලීසිය තවදුරටත් නීතිය නොතකමින් කටයුතු කරනු පෙනී යයි. වැඩිවෙමින් පවතින අපරාධ, ස්ත්‍රී දූෂණ ඉහළ අගයක් ගැනීම මේ පිළිබඳව උදාහරණයන්ය. මෙම රටේ මානව හිමිකම් උල්ලංගනය වන බවට හොදම නිදසුන් සපයනුනේ මාධ්‍ය වේදීන්ට අත්වන ඉරණම ඇසුරෙන්ය.

මාර්තු මස 22 දා බස් වලින් පැමිණි මැරයින් විසින් දිවයිනේ ප්‍රමුඛ රූපවාහිනී ආයතනයක් වූ MTV ආයතනයට ප්‍රහාරයක් එල්ල කරන ලදී. සිවිල් සංවිධාන ක්‍රියාකාරකම් රජයට මහත් හිසරදයක් සහ සැකයට තුඩුදෙන තත්වයක් බවට පත්වී ඇති බවක් පෙනී යයි. නිදහස සහ මහජන ආරක්ෂාව යන්න එකිනෙකට ප්‍රතිවිරුද්ධවූ තත්වයන් දෙකක් නොවන බව රජයට පෙන්වා දීම මාධ්‍ය වල සහ සිවිල් සමාජයේ වගකීමක්වේ. සිවිල් සමාජය සහ මාධ්‍ය යන දෙඅංශයම අර්බුදයට ලක්වී ඇත. සිවිල් සමාජයට රටවැසියන්ගේ දේශපාලන නිදහස පමණක් නොව සමාජයේ ධනාත්මන සමාජ ක්‍රියාවලීන්ද ප්‍රවර්ධනය කිරීම සඳහා කටයුතු කළයුතුවේ. මාධ්‍ය තමුන්ගේ අවංකභාවය පිළිබඳව නැවත සිතා බැලීමට කාලය එලැඹ ඇත.

මාර්තු මාසයේ ආර්ථිකය සම්බන්දයෙන් බලාපොරොත්තු නොවූ තත්වයන් කිසිවක් සිදුවූයේ නැත. ආර්ථික කරුණු පිළිබඳ සියලුම තීරණ ගැනීම මහමැතිවරණය නිමා වන තෙක් කල් තබන ලදී. කෙසේ නමුත් මෙසේ කල් තැබිමට අපහසු කරුන වන්නේ රජයේ මුල්‍ය අවශ්‍යතා සඳහා අවශ්‍යමුල්‍ය ප්‍රතිපාදන සොයාගැනීමයි. 2009 සඳහා වූ අයවැය ලේඛනය දැනටමත් අමතක කර දමා ඇත. භාන්ඩාගාරය ප්‍රකාශයට පත්කර ඇති ආකාරයට 2009 අයවැයේ හිගය මුලු දළ ජාතික නිෂ්පාදිතයෙන් 10.2% කි (අරමුදල් රහිතව). මෙය මුලින් බලාපෙරොත්තු වූ 7.0% වඩා වැඩි අගයකි. අරමුදල් සපයාගැනීම දුෂ්කරවූ බැවින් රජය මාර්තු මාසයේ මුල්භාගයේදී ඩොලර් මිලියන 100 ලංකා සංවර්ධන බැඳුම්කර නිකුත් කරන ලදි. රජයට මිලගු අයවැය ඉදිරිපත් කිරීම පහසුවන්නේ නැත. මෙහිදී අරමුදල් සපයන්නන් මුල්‍ය පාලනයේ විනය නගා සිටුවීමත් විදුලි බල මංඩලය ඛනිජතෙල් සංස්ථාව වැනි රජයේ ආයතන වල සිදුවන මුළ්‍යමය හානිය වලක්වාලන ලෙසටත් බලකරනු ඇත. මේ අතර රජය මැතිවරණය ජයග්‍රහණය කිරීම උදසා ඉටු කිරීමට අපහසු පොරොන්දු ජනතාව හමුවේ තබයි. මුල්‍යමය හිගය කපා හැරීමට ගනු ලබන පියවර මිලගු මුදල් ඇමතිවරයාට ලෙස ක්‍රියාකරනු ඇතැයි උපකල්පනය කළහැකි ශ්‍රී ලංකාවේ ජනාධිපතිවරයාට ඉතාමත් අමිහිරි අත්දැකීමක් වනු ඇත.

ජනවාරි මාසයේ සිට පැවැති දැඩිනියගය නිමා කරමින් මෙම මාසයේ දී වර්ෂාව ලැබිණි. කෙසේ වෙතත් දිවයිනේ ප්‍රදේශ ගණනාවකම තවමත් වියළි කාළගුණයක් දක්නට ලැබේ. විශේෂයෙන් ම කඳුකරයේ මෙම තත්වය වැඩි වශයෙන් දක්නට ලැබෙන අතර යටිබිම් පඳුරු ඉවත් කිරීමේ අරමුණ ඇතිව සිදුකළ ගිනි තැබිම් නිසා වන වනාන්තරයේ සැලකිය යුතු ප්‍රදේශයක් විනාශ වී ඇත. නැවත වතාවක් හිස ඔසවන ඩෙංගු වසංගතය මැඩ පැවැත්වීම සඳහා සෞඛ්‍ය අමාත්‍ය වරයා විසින් විශේෂ කාර්යය බලකායක් පිහිටුවන ලදි. මතබේදයට ලක්වූ විල්පත්තුව අභය භූමිය මැදින් දිවෙන පැරණි මන්නාරම් මාර්ගය ප්‍රතිසංස්කරණය කර විවෘත කිරීම පිළිබඳව මාධ්‍යයේ අවධානය යොමුවිණි. බොහෝ පරිසරවේදීන්ට අවශ්‍ය වූයේ මෙම මාර්ගය නැවත වසා දමා අභයභූමිය සුරැකීමයි.

## දර්ශකය

| | | | | | |
|---|---|---|---|---|---|
| වෙනසක් නැත | → | මඳ ප්‍රගතියක් පෙන්වයි | ↗ | මඳ පිරිහීමක් පෙන්වයි | ↘ |
| සැලකිය යුතු ප්‍රගතියක් පෙන්වයි | ↑ | සැලකිය යුතු පිරිහීමක් පෙන්වයි | ↓ | | |

# ජාතික විශ්ලේෂණය 26.02.2010 – 25.03.2010

## දේශපාලන සංදර්භය

මීලඟ පාර්ලිමේන්තු මැතිවරණය පැවැත්වෙන තීරණාත්මක දිනය අප්‍රියෙල් 08 වැනිදාය. මේ සඳහා වූ මැතිවරණ ප්‍රචාරක ව්‍යාපාර ආරම්භ වී ඇති අතර මැතිවරණ නීතිරීති වලට අනුකූලව මෙම සියලුම ප්‍රචාරක වැඩකටයුතු මැතිරවරණ දිනට පැය 48 කට පෙර නිමකළ යුතුය.

සමහර අපේක්ෂකයින්ට මැරතර්ජන වලට මුහුණ දීමටත් සිදුවී තිබේ. ප්‍රචණ්ඩකාරී සිදුවීම් ද වාර්තාවී තිබේ. මෙම තත්වය සම්බන්ධයෙන් සමහරු මෙම මැතිවරණ ක්‍රමයට එනම් මනාප ඡන්ද ක්‍රමයට චෝදනා කරති. මෙහිදී අපේක්ෂකයින් වැඩි දෙනෙක් සිටින නිසා තමන්ට මනාප වැඩිපුර දිනා ගැනීම සඳහා එකම පක්ෂයේ අය අතරම තරගකාරීත්වයක් ඇතිවේ. මෙම රටේ ජනතාව සාමකාමී වඩාත් හොඳ මැතිවරණයක් අපේක්ෂා කරති. මෙවැනි සාමකාමී තත්වයක් පැවැතුනු හොත් ඡන්ද දායකයින් වැඩි දෙනෙක් ඡන්දය දීමට ඉදිරිපත් වනු ඇත. එමනිසා නිදහස් සහ සාධාරණ මැතිවරනයක් සැමගේම අපේක්ෂාව බවට පත්වී ඇත. මෙම මැතිවරණයෙන් පසුව පැවැත්වීමට නියමිතව ඇත්තේ ප්‍රාදේශීය සභා ඡන්ද විමසීමය. නමුත් එයට තව කල් ඇත.

උතුරු නැගෙනහිර ප්‍රදේශ සංවර්ධනය වී ඇත්තේ ඉතාමත් සුලු වශයෙනි. උතුරු නැගෙනහිර ප්‍රදේශ වල අවතැන්වූවන් නැවත පදිංචි කිරීම මිට වඩා වේගවත්ව කළහැකිව තිබිණි. මෙය දුෂ්කර කාර්යයකි. එසේ නමුත් ත්‍රස්තවාදයට එරෙහි යුද්ධය අවසන් වී දස මාසයක් ගතවී ඇතත් මෙම අවාසනාවන්ත ශ්‍රී ලාංකික ජනකොට්ඨාශයේ සුභසාධනය සැලසීම වෙනුවෙන් ප්‍රමාණවත් ලෙස ක්‍රියාත්මක වී නොමැත. නව අන්තර් ජාතික ගුවන්තොටුපළක්, වරායක්, කර්මාන්තපුරයක්, අන්තර්ජාතික ක්‍රීඩාංගනයක් සහ සංස්කෘතික මධ්‍යස්ථානයක් සමගින් දකුණු පළාත වේගවත් ලෙස සංවර්ධනය කෙරේ. මෙය දිවයිනේ ආර්ථිකයේ කේන්ද්‍රස්ථාන බවට පත්වනු ඇති බවට ලකුණු පහළවී ඇත. කෙසේ වෙතත් මෙහිදී උතුරු නැගෙනහිර පළාත් අමතක කළ යුතු නොවේ. එසේ උවහොත් ත්‍රස්තවාදයේ අඳුරු සෙවනැලි නැවත මතුවීමට ඉඩ ඇත. දේශපාලන පක්ෂ තමන්ට වැඩි පාර්ලිමේන්තු ආසන ගණනක් දිනාගනිමින් ශක්තිමත් ආණ්ඩුවක් බිහිකර ගැනීමට වෙරදරයි. අපේක්ෂකයෝ අතිවිශාල පොරොන්දු සමුදායත් ජනතාව හමුවේ තබා ඇත. මෙම පොරොන්දු ඔවුන් ඉටු කරයිද? මේ මොහොතේ ශ්‍රී ලාංකික අපි වඩාත් හොඳ හෙට දිනයක් අපේක්ෂා කරමින් බලා සිටින්නෙමු.

## පාලනය

***"ආසියානු" ආකෘතියේ පාලන සැලැස්මක් ඉදිරිපත් කරයි***

අප්‍රියෙල් 08 වැනිදා පැවැත්වීමට නියමිත මහමැතිවරණයේදී ආණ්ඩු පක්ෂය ව්‍යවස්ථා සංශෝධනයක් සඳහා තුනෙන් දෙකක බලයක් ලබාගැනීමට අපේක්ෂා කරති. ජනවාරි 26 වැනිදා පැවැත්වුණු ජනාධිතිවරණයේදී මහින්ද රාජපක්ෂ මහතා විසින් 58% ඡන්ද ලබාගනිමින් සහ තම ප්‍රතිවාදී අපේක්ෂක සරත් ෆොන්සේකා මහතාට වඩා ඡන්ද මිලියන 1.8 ක් ලබාගනිමින් අපේක්ෂා කළ මට්ටමටත් වඩා ජයග්‍රහණයක් ලබාගත් හෙයින් විපක්ෂ දේශපාලන පක්ෂ වල බලාපොරොත්තු බිඳ වැටී ඇත. ආණ්ඩු පක්ෂයේ ජයග්‍රහණය පිළිබඳව මෙහිදී වැඩි ඉඩකඩක් ඇති අතර ගැටලුවකට ඇත්තේ එම ජයග්‍රහණය කොතරම් වැඩි ඡන්ද ගණනක් ලබාගනීද යන්න පමණි. මෙම මැතිවරණයේදී තියුණු තරගයත් පවතිනු දක්නට ලැබෙන්නේ ආණ්ඩු පක්ෂයේ මංත්‍රිවරුන් අතරය. ඔවුන්ගේ පාර්ලිමේන්තු අසුන රැකගැනීම සඳහා ඔවුනොවුන් අතර දැඩි තරගකාරී තත්වයක් දක්නට ලැබේ. ජනාධිපතිවරණයේදී පැවැති පාලනාධිකාරය වෙනස් කිරීමේ හැකියාවක් දක්නට ලැබුනු මුත් මෙහිදී එවැන්නක් දක්නට නොමැත. විපක්ෂ නායකයින්ට තමන්ට ඡන්දය ලබාදෙන ලෙස ඡන්ද දායකයන්ට පැවසීම අභියෝගයක්ව පවතී. විප-ක්ෂ ආධාරකරුවන් තුල පවතින්නේද රිනාත්මක ආකල්පයන්ය. තමන් ඡන්දය දෙනු ලැබුවත් ප්‍රතිපලය වෙනස් කරනු ඇතැයි ඔවුන් සිතති. විපක්ෂයට බලපාන මෙම ගැටලුව තවදුරටත් සංකීර්ණ වන්නේ රජයේ සම්පත් මැතිවරණ ව්‍යාපාරය වෙනුවෙන් යොදාගැනීම වැලැක්වීම සඳහා වූ මැතිවරණ නීතිරීති පිළිබඳව රජය එතරම් දුරට තැකීමක් නොකිරීම නිසාය. රජයේ සම්පත් වන ගොඩනැගිලි වාහන වැනිදෑ අයථා ලෙස මැතිවරණය වෙනුවෙන් යොදාගැනීමත් රජයේ මාධ්‍ය අයථා ආකාරයට මැතිවරණය වෙනුවෙන් භාවිතාකිරීමත් පසුගිය ජනාධිපතිවර-ණයේදීත් දක්නට ලැබුනු අතර මෙම තත්වය මහමැතිවරණයේදීත් පවතිනු ඇත.

එක්සත් ජාතීන්ගේ මහකොමසාරිස් බැන්කී මුන් ශ්‍රී ලංකාවේ මානව හිමිකම් පිළිබඳව තමාට උපදෙස් ලබාදීම සඳයා විශේෂඥයන්ගෙන් සම-න්විතවූ කණ්ඩායමක් පිහිටු වීමට කටයුතු කරන බව වාර්තා වූ අතර මෙය ශ්‍රී ලංකා රජයේ මහත් විවේචනයට ලක්විය. රජය මේ පිළිබඳව දිගින් දිගටම දැරූ මතය වූයේ LTTE සමග යුද්ධය පැවැති සමයේ කුමක් සිදුවූවත් එය රටේ අභ්‍යන්තරික කරුණක් බවයි. මෙම සමයේ සිදුවූ මානව හිමිකම් උල්ලංගනය වීම් පිළිබඳව පරීක්ෂණ කිරීමට අවශ්‍ය බව පැ-වසුණු දේශිය සහ විදේශීය රාජ්‍ය නොවන සංවිධාන රජයේ දැඩි විවේචනයට ලක්වූ අතර මෙහේදී වැඩි වශයෙන් තර්ජනයට ලක්වූයේ දේශිය ආයතනයන්ය. රජය මෙවර සුවිශේෂී ජයග්‍රහණයක් මහමැතිවරණයේදී ආසියානු ආකෘතියේ ආර්ථික සංවර්ධනයක් සඳහා ජනතාවගේ සහයෝගය ලබාගැනීමට අපේක්ෂ කරයි. වරද කරුවන්ට දඬුවම් නොලැබෙන සහ ඔවුන් සුරකින තත්වයක් පවතින බව කොළඹ නගර මධ්‍යයේ පිහිටි MTV ආයතනයට පහර දීම තුලින් නැවත වරක් පැහැදිලි විය. අද පවත්නා උපනතීන් වලින් තුලින් පැහැදිලි වන්නේ ස්වාධින වූ සංවරණ හා තුලන ක්‍රමයක් රටේ නොපවතින බවයි. මෙම ආකාරයට ප්‍රජාතන්ත්‍රවාදී සම්මතයක් නොතකා හැරීමත් පොරොන්දුවූ පරිදි ආර්ථික සංවර්ධනයක් ඇති කිරීමට අසමත් වීමත් තුලින් දිගුකාලීන වශයෙන් අහිතකර ප්‍රතිපල ඇතිවිය හැක.

## මානව ආරක්ෂාව

පසුගිය අවුරුද්දේ තරුණයන් දෙදෙනෙකු අත්අඩංගුවට ගෙන මරා දැමීමට ක්‍රියා කළ අඟුලාන පොලීසියේ ස්ථානාධිපතිවරයා සහ ඊට සම්බන්ධ නිලධාරීන් අත් අඩංගුවට ගත් නමුත් එම සිද්ධිය නොසලකා හරිමින් එම පොලිසියම ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කිරීමට නොහැකිවූ තරුණයකු අත්අඩංගුවට ගෙන පහරදීමට විරෝධය පාමින් ප්‍රදේශවාසීන් පොලීසිය ඉදිරිපිට උද්ඝෝෂණය කළහ. මෙම තරුණයා පසුව රෝහල් ගත කරනු ලැබිණි. මේ අතර නීතිවිරෝධි ලෙස ඕස්ට්‍රේලියාවට සංක්‍රමණය වීමට තැත්කළ තරුණයන් 25 දෙනෙක් මඩකලපුව පොලීසිය විසින් අත් අඩංගුවට ගන්නා ලදී.

පොලිසිය විසින් මාධ්‍ය වලට නිකුත් කරුණු ලැබූ වාර්තා වලට අනුව අප රටේ ස්ත්‍රී දූෂණය සහ ලිංගික අතවර සිදුවීම් බහුලව සිදුවේ. මෙ-වැනි සිද්ධියක් වාර්තා නොවන දිනයක් නොමැති තරම්ය. පියා විසින් තමාගේම දියණිය දූෂණය කිරීම, ගුරුවරයා විසින් සිසුවියක දූෂණය කිරීම විදුහල්පති විසින් සිසුවියක දූෂණය කිරීම වැනි සිද්ධීන් නිතර අසන්නට ලැබේ.

මෙම මස තුලදී වාර්තාවූ වඩාත් සිත් කම්පා කරවන සුලු සිදුවීම වූයේ සිවු හැවිරිදි අමිල සඳරුවන් නැමැති දරුවා සිය මව විසින් මාර්තු 04 වැනිදා කලුගඟට විසිකිරීමයි. අවසානයේ මව අත් අඩංගුවට ගන්නා ලදී. මෙය දේශපාලනික වශයෙන් නිවැරදිය. එසේ නමුත් මව මෙවැනි ක්‍රියාමාර්ගයක් ගත්තේ ඇයි යන්න කිසිවකු විසින් විමසීමට ලක් කලේද? දැන් ඔවුන් සිදු කරන්නේ කුමක්ද ? ඇය මෙවැනි ක්‍රියාවකට එළැඹුනේ ඇයි යන්න නෙවිමසා ඇයට දඬුවම් කිරීමය.

## මානව හිමිකම්

### ඡන්ද පෙත්සම්

මෙම මාසය ජනාධිපතිවරණයට පසුව එළැඹුන මාසයයි. ජනාධිපතිවරණ සමයේ දී සිදුවූ මානව හිමිකම් උල්ලංඝනය කිරීමේ සිදුවීම් ගණනාවක් සම්බන්ධයෙන් වූ මැතිවරණ පෙත්සම් ගණනාවක් අධිකරණය හමුවේ ගොනුකර ඇත. දැන් මෙම සිද්ධීන් පිළිබඳව තීන්දුවක් දීම අධිකරණයේ කටයුත්තකි. මෙම පෙත්සම් වලින් එකක් වූයේ උතුරු ප්‍රදේශයේ ඡන්ද දායකයින්ට පොරොන්දුවූ පරිදි ප්‍රමාණවත් අයුරින් ප්‍රවාහන පහසුකම් නොතිබීම නිසා ඡන්දය ප්‍රකාශ කිරීමේ අවස්ථාව නොලැබීම සම්බන්ධයෙන් විය.

අවතැන් කඳවුරු වල සිට නැවත පදිංචි කළ බෝහෝ පිරිසකට මෙම ජනාධිපති වරණයේදී ඡන්දය ප්‍රකාශ කිරීමේ අවස්ථා අහිමිවිය. තවත් අවස්ථාවකදී කිළිනොච්චියේ ඡන්ද පොළ පිහිටුවා තිබුනේ එහි පදිංචිකරුවන්ටද පහසුවෙන් ලඟාවිය නොහැකි ස්ථානයක බව උසාවියට පෙන්වා දෙනු ලැබිනි. මෙම ඡන්ද පොළට යාම සඳහා කිලෝ මීටර් 8 ක් පමණ දුර පයින් ඇවිද යායුතු විය. මෙම දිනයේ මහජන ප්‍රවාහන සේවා ක්‍රියාත්මක වූයේ නැත. මෙම තත්වයන් පදනම් කරගෙන ව්‍යවස්ථාවෙන් ඔවුන්ට උරුම කර දී ඇති අයිතිවාසි කමක් නොලැබී යාම තුලින අසාධාරණයට ලක්වීමෙන් මෙම ඡන්ද දායකයාන්ගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනයවී ඇති බවට තීන්දුවක් ලබාදෙන මෙන් පෙත්සමෙන් ඉල්ලීමක් කර තිබේ. එළැඹෙන මහමැතිවරණයේදී මෙවැනි තත්වයන් ඇති නොවීමටත් ඡන්දය ප්‍රකාශ කිරීමට සුදුසුකම් ලබා ඇති සැමට ඡන්දය ප්‍රකාශ කිරීමේ අවස්ථාව ලැබාදීම තහවුරු කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනෙනු ඇතැයි අපේක්ෂා කෙරේ.



Source: news.bbc.co.uk

### තොරතුරු ලබාගැනීමට ඇති අයිතිය

මෙම මාසයේදී ප්‍රජාතන්ත්‍රවාදී ජාතික සංධානය තමන්ගේ අන්තර්ජාල අඩවිය රජය විසින් අවහිර කරු ඇතැයිද තමන්ගේ නායකයා වන විශ්‍රාමික ජෙනරාල් වරයා වහාම නිදහස් කරන මෙන්ද ඉල්ලා සිටියේය. කෙසේ වෙතත් විදුලි සංදේශ නියාමන කොමිසම මෙම අවහිර කිරීම පිළිබඳව වාර්ථාව ප්‍රතික්ෂේප කළේය. මේ ආකාරයෙන් වෙබ් අඩවියක් අවහිර කිරීම ජනතාවගේ තොරතුරු ලබා ගැනීමට ඇති අයිතිය උල්ලංඝනය කිරීමක් ලෙස දැක්විය හැකිය. මෙම සම්බන්ධයෙන් රජයට චෝදනා කිරීමේ යම් සත්‍යයත් තිබේ නම් වහාම නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය.

### රාජ්‍ය මාධ්‍යයට එරෙහි පෙත්සම

මෙම මාසයේදී ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවට සහ ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාවට එරෙහිව මූලික අයිතිවාසිකම් පෙත්සම් දෙකක් අධිකරණය හමුවේ ගොනුකර ඇති බව වාර්තාවේ. මෙහිදී නැගි ඇති චෝදනාව වන්නේ මැතිවරණ කොමසාරිස්වරයා විසින් දෙන ලද නියාමනයන් උල්ලංඝනය කරමින් රාජ්‍ය දේපළ අයථා අන්දමින් මැතිවරණ ප්‍රචාරය සඳහා යොදාගත් බවයි. මෙහිදී චෝදනා කෙරෙන්නේ මෙම තත්වය තුලින් පෙත්සම්කරුගේ නීතිය ඉදිරියේ සමානාත්වතාවය පිළිබඳවත් නීතියේ ආරක්ෂාව ලැබීම පිළිබඳවත් වූ මූලික අයිතිවාසිකම උල්ලංඝනයවී ඇති බවත් නිදහසේ කථා කිරීමේ සහ අදහස් ප්‍රකාශ කිරීමේ අයිතීන උල්ලංඝනය වූ බවත්ය. එසේම දේශපාලන පක්ෂ අතර ගුවන්කාලය වෙන් කිරීමේ දී සැමට සාධාරණ අයුරින් සිදු නොකළ බවටත් වාර්තාවේ. මෙවැනි සිද්ධීන් මගින් නිදහස් සහ සාධාරණ මැතිවරණයක් පැවැත්වීමේ අවස්ථාව තර්ජනයට ලක්වන අතර ජනතාවගේ මානව අයිතිවාසිකම් නගා සිටුවීමටත් සුරැකීමටත් බාධාවන් එල්ලවේ. මෙවැනි සිදුවීම් එළැඹෙන මහ මැතිවරණයේ දී අවම වනු ඇතැයි අපේක්ෂා කෙරේ.




Source: Asiatribune

### රාජ්‍ය නොවන සංවිධාන පිළිබඳව විමසීම

සාමාන්‍ය තත්වයන් පැවැති කාලසීමාවේදී මෙන්ම හදිසි අවස්ථාවන්හිදී ද රාජ්‍ය නොවන සංවිධාන මෙරට වැසියන්ට අවශ්‍ය සහයෝගය සහ උපකාර ලබාදෙමින් වැදගත් මෙහෙයක් ඉටුකල බව ප්‍රතික්ෂේප කළ නොහැක. එසේම මෙම සංවිධාන අතුරින් ස්වල්පයක් වූ දූෂිත සංවිධාන වල ක්‍රියාකලාපයන් සිසා එම සංවිධාන පිළිබඳව නරක නාමයක් ඇති වීමට හේතුවූ බව බවද ප්‍රතික්ෂේප කළ නොහැක. මෙම ක්‍රියාමාර්ග නිසා රාජ්‍ය නොවන සංවිධාන සියල්ලම පිළිබඳව අයථා ලෙස ක්‍රියා කිරීම සම්බන්ධයෙන් චෝදනා එල්ල විය. මෙම සංවිධානයන්ගෙන් බොහොමයක් මානුෂීය ආධාර අවශ්‍ය පුද්ගලයින්ට අවශ්‍ය සහයෝගය ලබාදීම සඳහා ක්‍රියාත්මක වේ.

### පොලීසිය විනයගරුක බවට පත් කිරීම

මෙම මාසයේදී නීතිය උල්ලංඝනය කරමින් කටයුතු කළ පොලිස් නිලධාරීන්ට එරෙහිව පොලිස් පති තුමා විසින් විනයානුකූල ක්‍රියාමාර්ග ගත් අවස්ථාවන් කිහිපයක් වඩා වාර්තා විය. මෙය අගය කළයුතු තත්වයකි. ගල්කිස්ස මුහුදු වෙරළේදී තරුණියක් දූෂණය කලේ යැයි සම්බන්ධයෙන් ගල්කිස්ස පොලීසියේ අපරාධ අංශයට අනුයුක්ත පොලිසි කොස්තාපල්වරුන් 4 දෙනෙකු අත් අඩංගුවට ගෙන ගල්කිස්ස අධිකරණයට ඉදිරිපත් කරනු ලැබිනි. මොවුන් 4 දෙනාගේ වැඩ තහනම් කිරීමට පොලිස්පති වරයා කටයුතු කළේය. ඒ වාගේම පොලීසිය මගින් සිදු කරනු ලැබූ වැටලීමකදී පුද්ගලයකු මරණයට පත්වීම සම්බන්ධයෙන් ත්‍රිකුණාමලය මූලස්ථාන පොලිස් පරීක්ෂකයකු සහ පොලිස් නිලධාරීන් තිදෙනෙකු ගේ වැඩ තහනමට ලක්කරන ලදී. මෙම ක්‍රියාමාර්ග මගින් පොලිස්පතිතුමා පොලීසියේ විනය වර්ධනය කිරීමටත් එමගින් නැතිවී ගිය මහජන විශ්වාසය නැවත ගොඩනංවා ගැනීමටත් උත්සාහ දරන බව පෙනී යයි

කෙසේ වෙතත් මෙම මාසය තුලදී තවත් වාර්තාවකින් දැක්වූනේ ආරක්ෂක ලේකම්තුමාගේ උපදෙස් පරිදි ප්‍රධාන පොලිස් පරීක්ෂකවරුන් 8 දෙනෙකු වැඩ තහනමට ලක්වූ බවය. මෙය පොලිස් දෙපාර්තුමේන්තුවේ පරිපාලන කටයුතු දේශපාලන ඇඟිලි ගැසීම් වලට ලක්වන බව පැහැදිලිව පෙන්වා දේ. පොලීසියේ පිරිහීමට හේතු වන්නේ දේශපාලන ඇඟිලි ගැසීමය

## සිවිල් සමාජය හා මාධ්‍ය අවකාශය

මෙම සිවිල් සමාජය සහ මාධ්‍ය අවකාශය පිළිබඳව ලිවීම ආරම්භ කලේ මාර්තු මස 23 වැනි දාය එදින මේ සම්බන්ධයෙන් වැදගත් දිනයකි. මාර්තු 22 දින අප රටේ ප්‍රමුඛ රූපවාහිනී මාධ්‍ය ආයතයක් වන MTV ආයතනයේ ප්‍රධාන කාර්යාලයට මහ දවල් බස්රථ වලින් පැමිණි මැරයන් විසින් ප්‍රහාරයක් එල්ල කරනු ලැබිනි. මෙම රටේ අනෙකුත් පෞද්ගලික මාධ්‍ය ආයතන මෙන්ම MTV ආයතනයද කිසිදු පාර්ශවයකට පක්ෂපාතී නොවන ලෙස ම විසින් හඳුන්වා දීමට කැමැති දේශපාලන ප්‍රවෘත්ති වාර්තාකරණයක නියැලී සිටී. මෙවැනි අවස්තාවකදී කල හැකි සුදුසුම ක්‍රියාමාර්ගය වන්නේ මහජන මතය එළිදැක්වීමට ඉතිරිවී ඇති ස්වල්පවූ අවකාශය හෝ රැකගැනීමට ක්‍රියාකිරීමයි. සියලුම විශ්ව විද්‍යාල උපකුලපතිවරු සහ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසන් සභාවේ සභාපති වරයා පවත්නා රජයට තම පක්ෂපාතිබව පැහැදිලිවම ප්‍රකාශ කර තිබේ. සමහරවිට මෙසේ කිරීමට ඔවුන්ට සාධාරණ හේතු තිබිය හැකිය නමුත් මෙසේ විවෘත ප්‍රකාශ කිරීම උසස් අධ්‍යාපන ආයතන වන විශ්ව විද්‍යාල වල නිදහස් අදහස් දැක්වීම හා

අදහස් විවේචන කිරීමේ අවස්ථාවන්ට දැඩි බපෑමක් ඇති කරයි. මෙය ඇත්ත වශයෙන්ම ක්‍රියාකාරී සිවිල් සමාජයක් කරායෑම් ගමනට ඇති තවත් බාධාවක් ලෙසින් හැඳිනිවිය හැකිය

සිවිල් සංවිධාන වල ක්‍රියාකාරකම් රජයට මහත් හිසරදයක් බවට පත්වී ඇති බවක් පෙනීයයි. රජය සිවිල් සමාජය පිළිබඳව තේරුම් ගන්නේ නීත්‍යානුකූලව පත්වූ රජයේ ක්‍රියාමාර්ගයන්ට එරෙහිව ක්‍රියාත්මක වන්නා වූ ඒකකයක් ලෙසය. මහජන අධික්ෂණයට ලක්වීම එක්කෝ ඔවුන් ප්‍රතික්ෂේප කරන අතර එසේත් නැතිනම් අගය කිරීමට ලක් නොකරයි. මෙය තේරුම්ගත හැකිය. මහජන මතය ප්‍රකාශ කිරීමේ සහ රැක ගැනීමේ මුර බල්ලන් ලෙස ක්‍රියාත්මක වන්නේත් එහි ඒකාධිපති බලය ඇත්තේත් මාධ්‍යටය. සිවිල් සමාජයේ අසමත්භාවය මත එය රජයට මෙන්ම ජනතාවටත් එහි අවශ්‍යතාවය පිළිබඳව වටහා දීමට අසමත්වී ඇත. මෙම නිසා එය දේශපාලන කරුනු පිළිබඳව පමණක් යොමුවී ඇති නමුත් එය සිවිල් සමාජයේ කාර්යය භාරය නොවේ. රජය සිවිල් සංවිධාන රජයට තර්ජනයක් ලෙස සලකනු ලබන්නේ නම් සිවිල් සමාජයේ කාර්යය භාරය වන්නේ එය එසේ නොවන බවත් එහි කාර්යය වන්නේ හඳුනාගත් සමාජ අරමුණු අභිලාෂයන් ඉටු කර ගැනීම සඳහා සමාජයට සහයෝගය සැලසීමත් අනවශ්‍ය පරිදි රජය සමග ගැටුම් ඇතිකරවන තත්වයන්ට සමාජය තල්ලුවීම වලක්වා ලීම බවත් රජයට ඒත්තු ගැන්වීමය. මේ සඳහා සිවිල් සමාජය සහ මාධ්‍ය අතර ක්‍රියාකාරී සහජීවනයක් අවශ්‍යවේ.

සිවිල් සමාජයේ සහ මාධ්‍යයේ වගකීමක් වන්නේ නිදහස සහ මහජන ආරක්ෂාව යන්න එකිනෙක හා ගැටෙන්නක් නොවන බවට රජයට පැහැදිලි කිරීමය. මෙම අවස්ථාවේ එය සිදු කිරීම තරමක් අසීරුය. එසේ වීමට හේතු වන්නේ මේ සම්බන්දයෙන් බලපෑමක් කළ හැකි අය සිදුවීම් සම්බන්ධයෙන් වාර්ථා කිරීමට වඩා ඒවා පිළිබඳව බලපෑම් කිරීමට උත්සාහ කිරීමය. මුද්‍රිත මාධ්‍ය මෙහිදී නව ක්‍රමවේදයක් අනුගමනය කිරීම ආරම්භ කර ඇති බව පෙනී යයි. රාවය කතෘවරයා ඔහුගේ පුවත්පතේ සියලු පිටු බලධාරීන් පිළිබඳව විවේචනය කිරීම සඳහා වෙන්කර ඇති අතර පවත්නා රජයේ ක්‍රියාමාර්ග විවේචනය කරන්නන් අනුකම්පා විරහිතව ඔහුගේ භාෂා විලාශය භාවිතා කරමින් දක්ෂ අන්දමින් මැඩ පැවැත්වීම සඳහා ඔහු කතුවැකිය



සහ අදහස් සඳහා වූ පිටු තමන් වෙනුවෙන්ම වෙන්කර තබාගෙන සිටි.

ඩේලිමිරර් පුවත්පතේ පළවුනු කතු වැකියක් මගින් එක්සත් ජාතීන්ගේ මහකොමසාරිස් වරයා ශ්‍රි ලංකාව සම්බන්ධයෙන් අනුගමනය කරණු ලබන ක්‍රියාමාර්ගය ඉලක්ක කර තිබිණි (BAN goes Ballistic) මෙහිදී ඔහු විසින් ගත් ක්‍රියාමාර්ගය හරි හෝ වරදි වේවා මෙය තීරණය කරණු ලබන්නේ ලොකයේ රටවල් බොහොමයක් සාමාජිකවී ඇති මෙම සංවිධානය මගිනි. ඔහුගේ කොරියානු නම මෙසේ උපහාසාත්මකව කතුවැකියට යොදාගැනීම මගින් පුවත්පත් අධිරජයේ පතාක යෝධයකු වෙන්ම කතුවැකි මගින් අදහස් දැක්වීමේ කළාව ප්‍රගුන කළ D R විජයවර්ධනයන්ගේ ප්‍රමිතීනට අනුකූල නොවේ. ඔහුගේ පුත්‍රයා වන වර්තමාන මෙම පුවත් පතේ හිමිකරු විසින් මහමැතිවරණයේදී ඔහුගේ මැතිවරණ ප්‍රචාරක කටයුතු වලදී මෙතුමාගේ ජනප්‍රියතාවය යොදාගනු ලබයි. මෙහිදී ඔහු යටත්විජිත යුගයේ සිට ස්වාධින වූ රටකට පාලන බලය පැවරීමේ යුගයේදී පැවැති අගයයන් සුරැක-ීමට පොරොන්දුවේ.

සිවිල් සමාජය මෙන්ම මාධ්‍යයද අර්බුදයට ලක්වී ඇත. සිවිල් සමාජයට පුරවැසියන්ගේ දේශපාලන නිදහස ආරක්ෂා කිරීම පමණක්නොව මවක් විසින් දරුවකු ගඟට විසි කරන තත්වයට පත්වන තෙක් බලා නොසිට සමාජ ආරක්ෂණ ක්‍රියාමාර්ග ශක්තිමත් කිරීම පිළිබඳවද අවධානය යොමුකළ යුතුය. එසේම මුද්‍රිත සහ විද්යුත් මාධ්‍ය තමන් පුවත් ප්‍රසිද්ධියට පත් කිරීමේදී ඒවා එසේ සම්පූර්ණයෙන්ම ප්‍රසිද්ධ කළ යුතුද? එවායේ සත්‍යතාවය පිළිබඳව නැවත සලකා බැලීමට ලක්කළ යුතුය. මෙය සමහරවිට අනෙකුත් සාධක නිසා සිදුකිරීම අපහසු විය හැකිය. තත්වය එය නම් ඔවුන් වැඩිම ප්‍රේක්ෂක සංඛ්‍යාවත් නරඹන රූපවාහිනී නාලිකාව තමන්ගේ නාලිකාව බවත් වැඩියෙන්ම කියවන පුවත්පත තම පත්‍රය බවටත් කරන ප්‍රකාශ වලින් වැලකී සිටිය යුතුය. මාධ්‍ය සා-ක්ෂරතාවය අවශ්‍ය මට්මටම දියුණුවී නොමැති ශ්‍රි ලංකාව වැනි රටක ( දැනට මැතිවරණය සඳහා වෙනුවෙන් කරන පොස්ටර් සටන මෙයට උදාහරණයකි) මෙය සිංහල ප්‍රස්ථා පිරුලක් වන පනින රිළවුන්ට ඉනිමං බැඳිමක් ලෙස සැලකිය හැකිය.

## ආර්ථික සංධර්භය

ආර්ථික අංශයෙන් බලාපොරොත්තු නොවුනු අන්දමේ සිදුවීම් මෙම මාසයේදී වාර්තාවූයේ නැත. දේශපාලඥයින් සියලු දෙනාම මහත් උනන්දුවෙන් පාර්ලිමේන්තු මැතිවරණ ව්‍යාපාරයේ ප්‍රචාරක කටයුතු වල යෙදී සිටි නමුත් ඡන්දදායකයෝ මෙම මැතිවරනය පිළිබඳව එතරම් උනන්දුවක් නොදැක්වූහ. මාර්තු මාසයේ ආර්ථික වශයෙන් ගතයුතු සියලුම තීරන සම්බන්ධයෙන් වැඩි වශයෙන්ම භාවිතා වුනු යෙදුම වූයේ මැතිවරණය නිමා වන තෙක් කල් දමන ලදී යන්නයි. 2010 වසර සඳහා වූ අයවැය ලේඛනය මැතිවරණයෙන් අනතුරුව ඉදිරිපත් කරන බව රජය පවසයි. එසේම IMF ආයතනයද ඔවුන් විසින් ලබාදීමට නියමිතව තිබූ ඩොලර් බිලියන 2.6 ණය මුදලේ තෙවන වාරිකය වන ඩොලර් මිලියන 326 ලබාදීම පිළිබඳව මැතිවරණයෙන් පසුව නැවත විමසා බැලීමට ලක්කරන බව සඳහන් කළහ. අගෝස්තු මාසයේදී ඉවත්කිරීමට නියමිත GSP බදු සහනය නැවත ලබා ගැනීම සඳහා සාකච්ඡා කිරීමට රජයේ ජේෂ්ඨ නිලධාරීන් පිරිසක් බ්‍රසල්ස් නුවරට ගොස් යුරෝපීය සංගමයේ නිලධාරීන් හමුවූහ. එසේ නමුත් ඔවුන් යුරෝපීය කොමිසමෙන් නිශ්චිත පිළිතුරක් නොමැතිවම ආපසු පැමිණියහ. සමහර විට රාජපක්ෂ පරිපාලනය මැතිවරණයෙන් අනතුරුව ක්‍රියාත්මක වන ආකාරය පිළිබඳව විමසිල්ලෙන් සිටිනවා විය හැකිය.

මාර්තු මාසයේදී ප්‍රතිරක්ෂණ ගාස්තු සහ ත්‍රස්ත්‍ර වාදී රක්ෂණාවරණය වෙනුවෙන් වූ අධිභාරය අඩු කරන ලද අතර මෙය සම්පූර්ණයෙන් ම ඉවත් කිරීම සඳහා වූ ඇගැයීම මහමැතිවරණය නිමා වූ විට එක්සත් රාජධානියේ ලොයිඩ්ස් ආයතනය විසින් සිදු කරනු ඇත. කොළඹ කොටස් වෙළඳපොලේ සමස්ත මිළ දර්ශකය ආයොජකයින් සහ සමස්ත රට "තීරණයක් ගන්නා තුරු බලා සිටින" ආකාරයක් පෙන්නුම් කළේය. මාර්තු මාසයේ මුල භාගයේ සමස්ත මිළ දර්ශකයේ අගය 3800 ට මඳක් ඉහල අගයක් ගත් අතර මෙම තතවයේ 2.5% ක පමණ අඩුවීමක් මාසය අවසානයේ දක්නට හැකිවිය.

කෙසේ වෙතත් රජයේ මූල්‍ය අවශ්‍යතා සඳහා අවශ්‍ය ප්‍රතිපාදන මැතිවරණය අවසාන වන තෙක් බලා සිටිය නොහැක. 2009 සඳහා වූ අයවැය ලේඛනය දැනටමත් ඉවත දමා ඇත. භාණ්ඩාගාරය ප්‍රකාශ කලේ 2009 වසර සඳහා වූ අයවැය පරතරය දළජාතික නිෂ්පාදිතයෙන් 10.2% පමණ වූ ඉහළ අගයක් ගන්නා බවයි. මෙය මුලින් ඇස්තමේන්තු කළ අගයට වඩා 7.0% වඩා වැඩි අගයකි. මෙහිදී ඇත්තෙන්ම උපයාගත් ආදායම අපේක්ෂා කළ මට්ටමට වඩා අඩුවූ අතර වියදම අපේක්ෂා කළාට වඩා වැඩි විය.

ආදායම අඩුවීමට ප්‍රධාන වශයෙන්ම බලපෑවේ අපනයන ආදායමෙන් ඩෙලර් බිලියන 100 ක අහිමිවීමක් සිදුවීමයි. මෙම නිසා පෞද්ගලික අංශයෙන් බදුලෙස අයකර ගැනීමට තිබුනු ආදායම අහිමි විය. එසේම ආනයන තුලින් අපේක්ෂා කරනු ලැබූ බිලියන 400 ක මුදලක්ද නොලැබුනු අතර මෙම ආදායම ආනයන බදු වශයෙන් ඉපයීමට අපේක්ෂා කරනු ලැබිණි. වියදම් පාර්ශවය සලකා බැලුවහොත් පුනරාවර්ථන වියදම් වේතන හා වැටුප් සඳහා වූ ගෙවීම්, ලබාගත් ණය වෙනුවෙන් කරන ලද ගෙවීම් අපේක්ෂා කළ මට්ටමට වඩා 7.4% කට වඩා වැඩිවූ අතර ප්‍රාග්ධන වියදම් 15.1% ට වඩා අඩු අගයක් ගත්තේය. කෙසේ වුවක් දෙවනුව සඳහන් කරන ලද ප්‍රාග්ධන වියදම් අඩුඅකිරීම ඉහතින සඳහන් කළ වියදම උෟණපූර්ණය කිරීමට තරම් ප්‍රමාණවක් වූයේ නැත. රැකියා අවස්ථා ප්‍රවර්ධනය කිරීමටත් ආර්ථික වර්ධනය සඳහාත් ප්‍රාග්ධන වියදම් අඩුකිරීම මගින් අයහපත් බලපෑමක් ඇති කරයි.

රජය විසින් ක්‍රියාත්මක කරන ලද මෙගාවොට් 900 ක ධාරිතාවයකින් යුත් ගල් අගුරු මගින් ක්‍රියාත්මක වන නොරොච්චෝලේ විදුලි බලාගාරය ආර්ථික වර්ධනයට කැපී පෙනෙන බලපෑමක් සිදු කරයි. මෙගා වොට් 300 ක ධාරිතාවයකින් යුත් මෙහි දෙවන අදියර මෙම මාසයේදී ආරම්භ විය. කෙසේ වෙතත් මිහින් එයාර් වැනි ආර්ථික වශයෙන් පලදායී නොවන ව්‍යාපෘතින් ' රාජ්‍ය බදු ආදායමට බරක් වන

අතර මෙවැනි ව්‍යාපෘති මගින් රාජපක්ෂ පිරිපාලනයේ ආර්ථික වශයෙන් වූ ප්‍රාතිහාර්යය සාක්ෂාත් කර ගන්නේ කෙසේදැයි යන්න ගැටලුවකි. අරමුදල් සපයා ගැනීම දුෂ්කර වූ බැවින් රජය ඩොලර් මිලියන 100 ක ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර නිකුත් කිරීමට කටයුතු කලේය. මෙහිදී දේශිය සහ විදේශිය බැංකු විසින් මෙම බැඳුම් කර මිළදී ගන්නා ලදී.

පසුගිය මාස 15 -17 කාලයේදී තෙල් මිළ විශාල වශයෙන් පහළ යාම මහබැංකුවට උද්ධමනය පාලනය කිරීමට මහත් උපකාරී විය. කොළඹ පාරිභෝගික මිළ දර්ශකය පසුගිය වසරට සාපේක්ෂව මෙම මාර්තු මාසයේ 6.3% ක් විය. මෙය පසුගිය පෙබරවාරි මාසයේදී 6.9% කි මහබැංකුව නිවේදනය කලේ තම ණය අනුපාතික අගයන් නොවෙනස්ව පවත්වා ගන්නා බවය. කෙසේ වෙතත් ත්‍රෛමාසික භාණ්ඩාගාර බිල්පත් අනුපාතික ඇසුරෙන් වෙළඳ පොළි අනුපාතිකයන් ඉහළ යාම තුලින් පෙනී යන්නේ රජය පාර්ශවයෙන් අරමුදල් සඳහා ඉල්ලුමක් ඇතිවී තිබෙන බවය.

රජයට මෙවර අයවැය ලේඛනය ඉදිරිපත් කිරීම පහසු වන්නේ නැත. අරමුදල් සපයන්නන් මූල්‍යමය වශයෙන් පාඩු සිදුවන ලංකා ඛනිජතෙල් සංස්ථාව, ලංකා විදුලිබල මංඩලය වැනි ආයතන වල මූල්‍ය විනය ඉහළ නැංවීමට බල කරනු ඇත. කෙසේ වෙතත් රජය ඉටුකළ නොහැකි මට්ටමේ පොරොන්දු ඡන්දය ලබාගැනීම ඉලක්ක කරගෙන ජනතාව හමුවේ තබයි. රජයේ සේවකයින් සඳහා පඩි වැඩිවීමක් ලබාදෙන බව රජය පවසයි. රැකියා විරහි. උපාධිධාරීන් 17000 ක් සඳහා රජයේ රැකියා ලබාදීමට ඔවුන් පොරොන්දුවී ඇත. වෙළඳාම මත පැනවූ බදු කපාහැර තිබේ. අයවැය හිගය පියවීම මීලඟ මුදල් ඇමතිවරයා වශයෙන් කටයුතු කරනු ඇතැයි උපකල්පනය කළහැකි ශ්‍රී ලංකාවේ ජනාධිපතිවරයාට අප්‍රසන්න අත්දැකීමක් වනු ඇත.

## මානුෂීය සහ සංවර්ධන අවකාශය

මැතිවරණ උණුසුමත් සමගම අවතැන්වූවන් පිළිබඳ කටයුතු කිරීම පසෙකට තල්ලුවී ඇත. මෙම සමය තුල බිම් බෝම්බ ඉවත් කිරීමේ කටයුතු දිගින් දිගටම සිදුවූවත් අලුතින් නැවත පදිංචි කළ අවස්ථාවන් වාර්තා නොවේ. මෙම නිසා මෙම කටයුතු වලට ඉක්මනින් මැදිහත්වීමේ අවශ්‍යතාවය වැඩිවී ඇත.

මේ අතර කලුතර ප්‍රදේශයේ මවක විසින් තම දරුවා කලුගඟට විසිකිරීමේ සිද්ධියට මාධ්‍ය මගින් පුලුල් ලෙස වාර්තා කර තිබිණි. මෙම පවුල සුනාමියට ගොදුරු වී දුගීකමෙන් ආගාධයට වැටුණු පවුලකි. මෙයින් අපට සිහිකැඳවන්නේ සමෘද්ධිමත් යැයි සැලකෙන බස-්නාහිර පළාතේ පවා මෙසේ කිසිවකුගේ අවධානට ලක්නොවුනු දුගී කමේ ගැලුනු මෙවන් ක්‍රියාවලට පෙළඹෙන සුලු ජනතාව සිටින බවය. එසේම අප වැනි මානුෂිය සේවා සපයන ආයතන වලට ද මෙමගින් පණිවිඩයක් ලබා දේ. එනම් ද්‍රව්‍යමය ආධාර සැපයීමෙන් පමණක් අප විසින් සේවා සපයනු ලබන ජනතාවගේ ජීවන තත්වයන් නංවාලිය නොහැකි බවය. මෙම ද්‍රව්‍යමය ආධාර සමගම මනෝසමාජීය සහන සේවාවන්ද ක්‍රියාවට නැංවිය යුතුවේ. දෙන ලද ආධාර මගින් ප්‍රතිලාභීන්ට වෙත නියමාකාර ප්‍රතිලාභ අත්වීද යන්න තහවුරු කර ගැනීම සඳහා ඔවුන් සමග යම් කාලසීමාවක් යන තෙක් සම්ප සම්බන්ධතාවක් පවත්වාගෙන යාමද වැදගත්වේ.

### මැදිහත්වීමට ඇති අවකාශය ?

චිලී රටේ ඇතිවූ භූමිකම්පාවත් සමගින් ශ්‍රී ලංකාව වෙත ලැබිය හැකි අධාර තවදුරත් අඩුවිය හැකිය. මෑතකදී ඇතිවූ තත්වයන් හමුවේ රජය සහ අන්තර් ජාතික ආයතන අතර යහපත් සම්බන්ධතාවක් වර්ධනයක් අපේක්ෂා කළ නොහැකිය.

## පරිසරය

ජනවාරි මාසයේ සිට දිවයිනේ බොහෝ ප්‍රදේශ වලට බලපෑ වියළි කාළගුණය නිමාවට පත්කරමින් වර්ෂාපතනය ඇතිවිය. කෙසේ වෙතත් බොහෝ ප්‍රදේශ වල වියළි කාළගුණය දිගටම දක්නට ලැබේ. පඳුරු වලින් සමන්විතවූ යටිවගාව එළිපෙහෙළි කිරීම සඳහා ගිනිතැබීම නිසා විශේෂයෙන් කඳුකරයේ පිහිටි වනාන්තර ලැව්ගිනි වලට ගොදුරුවිය. ගිගුරුම් සහිත වැසි සමග ඇතිවූ අකුණු ගැසීම් නිසා දෙදෙනෙකු මරණයට පත්වූ බව වාර්තා විණි.

මාර්තු 27 දින ශ්‍රී ලංකාව ලෝකයේ නගර 4000 ක් සමග මිහිතල හෝරාව සැමරීම සඳහා එක්විය. මෙහිදී පැයක කාලසීමාවක් සඳහා අත්‍යාවශ්‍ය නොවන විදුලි පහන් නිවා බලශක්තිය පිරිමැසීම සංකේතාත්මකව අගයනු ලැබිණි.

නැවත වරක් දිවයින පුරා නැග එන ඩෙංගු වසංතගතය මැඩ පැවැත්වීම සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් විශේෂ කාර්යය බලකායක් පිහිටුවනු ලැබිණි. අදවන විට ඩෙංගු රෝගය වැලැඳීම නිසා පුද්ගලයින් 60 න් මරණයට පත්වී ඇත. එකතැන රැඳුනු පැහැදිලි පිරිසිදු වතුරේ බිත්තර දමනු ලබන ඩෙංගු මදුරුවා මාර්ගයෙන් මෙම රෝගය පැතිරී යයි. මෙම නිසා පිරිසුදු පරිසරයක් පවත්වා ගෙන යාමත් නල ජලය භාවිතයට ගැනීමත් මෙම උවදුර මැඩ



පැවැත්වීමේ දී ඉතා වැදගත් වේ.

මාර්තු 22 ට යෙදුනු ලෝක ජල දිනය ශ්‍රී ලංකාව සමරන ලද්දේ ජලය පිරිපහදු කිරීම කිරීම සඳහා නව යන්ත්‍රාගාරයක් ජලසම්පාදන හා ජලාපවාහන මංඩලය මගින් අඹතලේ ප්‍රදේශයේ පිහිටුවීම මගිනි. ඕලන්ද රජයේ ආධාර ඇතිව ඉදිවන මෙම ව්‍යාපෘතිය 2015 වසරේදී නිමාවට පත්කිරීමට සැලසුම් කර ඇති අතර මෙමගින් ජනගහණයෙන් 85% කට බිමට සුදුසු ජලය සැපයීමට හැකිවනු ඇත. මීට අමතරව ශ්‍රී ලංකාවේ වැසි ජලය එක රැස් කිරීමේ සං-සදය මගින් වැසි ජලය එක්රැස් කර ප්‍රයෝජනයට ගතහැකි ආකාර පිළිබඳව සාකච්ඡා කරන ලදී. මෙම අවස්ථාව නාගරික සංවර්ධන අධිකාරියේදී පැවැත්වූ අතර එහිදී අමාත්‍යවරයා විසින් සඳහන් කළේ මතු ඉදිකරන ලබන සියලුම ගොඩනැගිලි වල වැසි ජලය ප්‍රයෝජනයට ගත හැකි ආකාරය පිළිබඳව සැලසුමක්ද ඇතුලත් වියයුතු බවයි.

මතබේදයට තුඩුදුන් විල්පත්තුව අභය භූමිය මැදින් දිවෙන පැරණි මන්නාරම මාර්ගය පිළිබඳව මාධ්‍යවල අවධානයට යොමුවිය. මෙම මාර්ගය මහජනතාව සඳහා විවෘත නොකර තබා ගැනීමට බොහොමයක් පාර්ශව උත්සාහ දැරූහ. මෙයට සමාන්තරව තවත් මාර්ගයක් දිවෙන අතර මෙම මාර්ගය නැවත විවෘත කිරීමේ සැබෑ අවශ්‍යතාව කුමක් දැයි හරියටම පැහැදිලි නැත. මෙමගින් දැනටමත් තර්ජනයට ලක්වී ඇති අභයභූමියේ මායිම් තවදුරටත් අනාරක්ෂිත වනු ඇත.

# දිස්ත්‍රික්ක විශ්ලේෂණ 27.02.2010 - 26.03.2010

## අම්පාර

මැතිවරණය සම්බන්ධ අයතා ක්‍රියා සහ මානව හිමිකම් උල්ලංගනය වීමේ අවස්ථාවන්හි වැඩිවීමක් අම්පාර දිස්ත්‍රික්කයෙන් වාර්ථාවේ. මෙම සිදුවීම් පිළිබඳව පොලීසිය නොසලකා හැරීම තුලින් මහජනතාව සහ පොලීසිය අතර පවතින යහපත් සබඳතාවන්ට අයහපත් බලපෑමක් ඇතිවී තිබේ. නැවත පදිංචි කිරීම දිගින් දිගටම ක්‍රියාවට නැගෙද්දී තමන්ට හිමිව තිබුණු ඉඩම් වෙනත් ජනවර්ගයක් විසිය් ආක්‍රමණය කර නීත්‍යානුකූල නොවන අන්දමින් පරිහරණය කරන අවස්තාවන් නිසා ඉඩම් සම්බන්ධයෙන් පැනනගින ගැටලු ජනකොට්ඨාශ-යන් අතර ගැටුම් තත්වයන් දක්වා වර්ධනය වීමට ඉඩප්‍රස්තා ඇත.

මහමැතිවරණය සඳහා වූ මැතිවරණ ව්‍යාපාරය උනුසුම් අන්දමින් දක්නට ලැබෙන මුත් මහජනතාව මේ පිළිබඳව දක්වන්නේ මද උනන්දුවකි. විවිධ දේශපාලන පක්ෂ වල සහයෝගය ලබන ආයුධ සන්නද්ධ කණ්ඩායම් වල ක්‍රියාකාරීත්වය සම්බන්ධයෙන් ජනතාව කනස්සල්ලට පත්වී සිටිති. මෙහිදී දිස්ත්‍රික්කයේ ජනතාවගේ ආරක්ෂාව සැලසීමට අවශ්‍ය පියවර ගැනීමට බලධාරීන්ගේ අවධානය වහාම යොමුවිය යුතුය.

## මඩකලපුව

දිස්ත්‍රික්කයේ අනවශ්‍ය ආකාරයට යුද හමුදා සහ නාවික හමුදා පිහිටු වීමට රජය කටයුතු කරන්නේ යැයි දෙමළ ජාතික සංධානය රජයට චෝදනා කරයි. මේ අතර රජය පවසන්නේ මෙසේ කඳවුරු පිහිටුවීමේ අරමුණ වන්නේ ඉතිරිව සිටින LTTE සාමාජිකයින්ගෙන් සහ අනෙකුත් තර්ජන වලින් සාමාන්‍ය වැසියන් ආරක්ෂා කර ගැනීම සඳහා බවයි.

ඕස්ට්‍රේලියාවට නීතිවිරෝධී ලෙස සංක්‍රමණය වීමට තැත්කිරීමේදී 25 දෙනෙකු අත්අඩංගුවට ගනු ලැබීමෙන් අනතුරුව පොලිස් මාධ්‍ය ප්‍රකාශක ප්‍රසන්න ජයකොඩි පැවසුයේ නීතිවිරෝධී සංක්‍රමණ ඉහළ ගොස් ඇති බවයි. මෙම නීති විරෝධී සංක්‍රමණ ඉහළයාම පිළිබඳව මහජනතාවගේ මතය වන්නේ අනාගතය සම්බන්ධයේ සහ ආරක්ෂාව සම්බන්ධයෙන් පවත්නා අවිනිශ්චිත තත්වය මෙම නීතිවිරෝධී සංක්‍රමණයන් වර්ධනයට හේතු වන බවයි.

## කොළඹ

එලැඹෙන මහමැතිවරණයට අපේක්ෂකයෝ විශාල සංඛ්‍යාවක් තරඟ වදිති. මෙය සුවිශේෂී තත්වයක් ලෙස හැඳින්විය හැකිය. මෙයට ඉදිරිපත්වී ඇති ස්වාධීන කණ්ඩායම් සංඛ්‍යාව ලියාපදිංචි දේශපාලන පක්ෂ ගණනද ඉක්මවා යයි. ජෙනරාල් සරත් ෆොන්සේකාද කොළඹ දිස්ත්‍රික්කයේ අසුනක් සඳහා තරඟ වදී. ඔහු ජනතා විමුක්ති පෙරමුණ මගින් සංවිධානය කරන ලද ප්‍රජාතන්ත්‍රවාදී ජාතික සංධානයේ නායකත්වය දරයි. මෙම මැතිවරණයේදී කැපී පෙනෙන විපක්ෂ කණ්ඩායම් වන්නේ එක්සත් ජාතික පක්ෂය සහ ජනතා විමුක්ති පෙරමුණයි. මෙම ප්‍රධාන විප-ක්ෂයේ බෙදීම දැනට බලයේ සිටින සංධානයට නැවතත් සුලුතර බහුතරයකින් යුතුව හෝ රජයක් පිහිටුවීමේ අවස්ථාව සැලසීමට මග සලයසි. මෙහිදී එක්සත් ජනතා නිදහස් සංධානයට තුනෙන් දෙකක බහුතරයක් ලබාගැනීමට සමත් වුවහොත් ඔවුන් පවතින ව්‍යවස්ථාව වෙනස් කිරීමට කටයුතු කරනු ඇතැයි අපේක්ෂා කළ හැකිය. කෙසේ වෙතත් මෙහිදී කළයුතු දේශපාලනික වෙනස් කම් නොසලකා හරිමින් ආඥාදායක ව්‍යවස්ථාමය වෙනසක් ඇති කිරීමටද ඉඩනඩ පවතී.

මෙම මැතිවරණයේදී බහුතරයේ ඡන්ද බෙද-මකට ලක්විය හැකි බැවින් සුලුතර කොටස් වලට තමන්ගේ ඡන්ද බලය පෙන්වීමට අවස්ථාවක් හිමිවේ. කෙසේ වෙතත් දෙමළ ජනතාවගෙන් විශාල පිරිසක් අවතැන්වී සිටීමද මෙහිදී අවධානයට ලක්වී ඇත. ඔවුන්ගේ ඡන්දපත්‍රිකා ලබාදීම සඳහා යම් උචිත පියවරක් ගැනීමට මැතිවරණ කොමසාරිස් වරයා කටයුතු කලයුතුය.

සංචාරක කර්මාන්තය නංවාලීමට ලෝක බැංකුවෙන් ඩොලර් මිලියන 18 ක මුදලක් ලැබී ඇති අතර තවත් ඩොලර් මිලියන 40 ක මුදලක් කොරියාවේ ආනයන අපනයන බැංකුවෙන් හැටන් -නුවරඑළිය මාර්ගය සංවර්ධනය කිරීම සඳහා ලැබී ඇත. මෙම ආයෝජන ශ්‍රී ලංකාවේ ආර්ථිකය සහ යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සඳහා වර්තමාන රජය ගෙනයන වැඩ පිළිවෙළ ශක්තිමත් කිරීමට උපකාරී වනු ඇත.

## යාපනය

රජය සමග සම්බන්ධවී සිටින දේශපාලන පක්ෂ ඔවුන්ගේ මැතිවරණ ව්‍යාපාරය ප්‍රබල අන්දමින් කරගෙන යන අතර විපක්ෂ කණ්ඩායම් තරමක නිහැඩියාවකින් එම කටයුතු වල යෙදෙන බව පෙනී යයි. විපක්ෂයට සම්බන්ධ අපේක්ෂකයින් තර්ජනය කිරීම් වල බඳුන් වී ඇති අතර සමහරුන්ට පහර දී ඇත. මෙම මැතිවරණ ව්‍යාපාරයේ කටයුතු වලට තරුණයන්ගේ ක්‍රියාකාරී සහභාගිත්වය අවම මට්ටමක පවතින අතර ප්‍රසිද්ධියේ තමන් සහයෝගය දක්වන පක්ෂය පිළිබඳව හෙළිකිරීමට බොහෝදෙනෙක් අකමැත්තක් දක්වති. යාපනයේ වෙළදාම් කටයුතු දියුණු වී ඇති අතර රජය විසින් ක්‍රියාත්මක කරන ලබන සංවර්ධන ව්‍යාපෘති දිස්ත්‍රික්කයේ දියුණුව ඉක්මන් කිරීමට ඉවහල්වනු ඇතැයි අපේක්ෂා කෙරේ.මේ අතර අවතැන් වූවන් නැවත පදිංචි කිරීමේ කටයුතු කෙරෙහි බලධාරීන්ගේ අවධානය කඩිනමින් යොමුවිය යුතුය.

## මන්නාරම

අත්අඩංගුවේ පසුවන LTTE සාමාජිකයින්ගෙන් සහ මහජනතාවගෙන් ලත් තොරතුරු අනුව ආරක්ෂක හමුදා විසින් LTTE සංවිධානය විසින් අඩම්පන් සහ කිලිනොච්චි ප්‍රදේශයේ පොළොව යට සඟවා තබන ලද ආයුධ සහ උණ්ඩ තොගයක් ගොඩ ගන්නා ලදී.

බිෂොප්වරු කණ්ඩායමක් සහනාධාර බෙදාදීමට හා නැවත පදිංචිවූවන්ගේ අත්‍යාවශ්‍ය ද්‍රව්‍ය සම්බන්ධයෙන් තොරතුරු ලබා ගැනීම සඳහා මන්නාරම සහ වවුනියාව ප්‍රදේශයේ සංචාරය කළහ. මෙහිදී ඔවුන් විසින් බයිසිකල් 50 ක් සූර්ය බලයෙන් සහ ක්‍රියාත්මක වන සහ ලාම්පු, පාසල් සිසුන් සඳහා රෙදි ඇතුළු රුපියල් මිලියන 3.5 කට අධික වටිනාකමකින් යුත් භාණ්ඩ බෙදාදෙනු ලැබිය. මේ අය වාර්තා කලේ නැවැත පදිංචි වූවන්ගෙන් 50% ක ටම දඅඩි හිරු රශ්මියෙන් ආරක්ෂාවීම සඳහා ඇත්තේ රජයෙන් සපයන ලද සෙවිලි තහඩු පමණක් බවයි. එසේම මෙම ප්‍රදේශයේ බිමට සුදුසු ජලය ලබා ගැනීමද දුෂ්කරය. පාසල් සිසුන්ට පාසල කරා කිලෝමීටර් 3- 4 දක්වා දුරක් පයින් ඇවිදයාමට සිදුවේ. ඔවුන්ට ලැබෙන ආහාර ප්‍රමානයද සීමිතය. එසේම මෙහි සිටින ජනතාව ඔවුන්ට යුද්ධයේදී අහිමිවූ තමන්ගේ දේපළ වන වාහන, කෘෂිකාර්මික, ධීවර උපකරණයනාදිය ලබාගැනීමට උපකාරීවන මෙන් රජයෙන් ඉල්ලා සිටිති. බොහෝ දෙනෙකුට තවමත් රැකියාවක් ලැබී නොමැත. නැවත පදිංචියට ගිය වැසියන්ට තමන්ගේ දේපළ යුද්ධයෙන් විනාශවී ඇති අයුරුත් සොරුන් වින් පැහැරගෙන ඇති අයුරුත් නිරීක්ෂණය කළහැකි විය. නිල ලිපිලේඛන ලබා ගැනීමේදී විශේෂයෙන් මරණ සහතික ලබාගැනීමේදී ඔවුන් තවදුරටත් දුෂ්කරතා වලට පත්වේ.

මේ අතර විශේෂයෙන් උතුරු සහ නැගෙනහිර පළාත ඇතුළුව රටේ පවත්නා දැඩි නියගය නිසා යෝධ වැව සිඳීයමින් පවතී. මෙම නිසා මෙවර වගා කර ඇත්තේ වගා කළ හැකි අක්කර 23000 කින අක්කර 16000 ක් පමණි. මෙම වගාකළ අක්කර 16000 න් අක්කර 3000 ක් ජලය නොමැතිවී නිසා විනාශ වී ඇත.

යුද්ධයේ නිමාවත් සමගම ඉංදියාවේ අනාථ කඳවරු වල රැඳීසිටින ශ්‍රී ලංකික අනාථයින් බොහොමයක් නැවත පැමිණීමට අපේක්ෂාවෙන් සිටිති. කෙසේ වෙතත් මෙහිදී ඔවුන් අවශ්‍ය ලියකියවිලි සකසා ගැනීමේදී බලවත් දුෂ්කරතාවන්ට මුහුණ දෙන බව වාර්තාවේ. කෙසේ වෙතත් තමිල්නාඩු බලධාරීන් පවසන ආකාරයට මෙම අනාථයින්ගෙන් සුළු සංඛාවක් ශ්‍රී ලංකාවට පිටත්ව ගොස් ඇත.

දිගුකාලක් තිස්සේ පැවැති බලාපොරොත්තුවක් ඉටුකරමින් මන්නාරම් දූපත සහ ප්‍රධාන ගොඩබිම සම්බන්ධ කරන පාළම මාර්තු 18 වැනිදා ජනාධිපති මහින්ද රාජපක්ෂ විසින් විවෘත කරන ලදී. මෙම පාළම ජපාන සහයෝගිතා බැංකුවේ අරමුදල් යටතේ ක්‍රියාවට නැංවුනු ව්‍යාපෘතියක් මගින් රුපියල් මිලින 2460 ක වියදමින් ඉදිකරන ලදී .

## ත්‍රිකුණාමලය

ත්‍රිකුණාමළයේ දෙමළ ජනතාව දෙමළ පක්ෂ වල ජයග්‍රහණය වෙනුවෙන් සහයෝගය දක්වති. මෙහිදී දෙමළ ජාතික සංධානය දිස්ත්‍රික්කයේ පැහැදිලි ජයග්‍රහණයක් ලබා ගැනීම සඳහා වෙහෙසෙති. කෙසේ වෙතත් තවත් දෙමළ පක්ෂ ගණනාවක් ද තරඟවදින බැවින් මෙම පක්ෂ අතර ඡන්ද බෙදීයාමක් අපේක්ෂා කළ හැකි අතර තියුණු තරගයක් ඇතිවේ යැයි අපේක්ෂා කළ හැකිය. දෙමළ ජනතාවගේ ප්‍රශ්න වලට නිසි අවධානය යොමුවන්නේ දෙමළ ජාතික අපේක්ෂකයින් පාර්ලිමේන්තුවට තේරී පත්වුවහොත් පමණක් යැයි දෙමළ ජනතාව සිතති.

ලගදී පැවැත්වීමට නියමිත පාර්ලිමේන්තු මැතිවරණය සංචාරක කර්මාන්තයට අහිතකර ලෙස බලපා තිබේ. සංචාරක හෝටල් නිකේතන හා මිට සම්බන්ධ කර්මන්ත සංචාරකයින් පැමිනීම අඩුවීම නිසා මුල්‍ය අර්බුද වලට මුහුණ දී සිටී. මේ අතර A9 මාර්ගය නැවත විවෘත කිරීම නිසා දිස්ත්‍රික්කයේ ව්‍යාපාරික කටයුතු දියුණු වෙමින් පවතී. මෙමනිසා නව රැකියා අවස්ථා සහ ආදායම් ඉපැයීමේ අවස්ථා ජනිත

කර ඇත. අවුරුදු 30 කට පසුව කොනේස්වරන් නගරය පුරාම පැවැත්විනි මෙම මහෝත්සවය හින්දු කොවිලේ වාර්ෂික පෙරහැර ත්‍රිකුණාමළය ඇරඹුනේ මාර්තු මස 29 වැනිදාය.

## වව්නියාව

එළැඹෙන මහමැතිවරණය සඳහා තරග වැදීමට දේශපාලන පක්ෂ සහ ස්වාධින කණ්ඩායම් රැසක් ඉදිරිපත් වීම නිසා වවුනියාවේ ප්‍රජාතන්ත්‍රවාදය යහපත් අකාරයෙන් ක්‍රියාවට නැංවෙන බවක් පෙනීයයි. අනෙකුත් මැතිවරණ දිස්ත්‍රික්කයන් හා සසඳද්දී වවුනියාව දිස්ත්‍රික්කයෙන් ඉදිරිපත් වන අපේක්ෂකයින්ගේ සංඛ්‍යාව අඩු අතර එසේම මැතිවරණය හා සම්බන්ධ සිද්ධින් මැතිවරණ ප්‍රචණ්ඩත්වයද අඩුවෙන් වාර්තාවිය.මැතිවරණය සම්බන්ධයෙන් මහජනතාවගේ උනන්දුවද අවම මට්මටක පවතින බව පෙනීගියේය. මෙහිදී විනිවිද පෙනෙන සුලු ඡන්ද පෙට්ටි මෙවර මැතිවරණයේදී යොදා ගැනීමට අපේක්ෂිතය. මෙහිදී ජනතාවට මෙම පෙට්ටි පිරෙන ආකාරය නිරීක්ෂණය කිරීමට හැකිවේ. වවුනියාව දිසාපතිතුමා විසින් කිළිනොච්චි සහ මුලතිවු දිස්ත්‍රික්ක වල සිට වවුනියාවේ ඡන්ද මධ්‍යස්තාන කරා පැමිණිමට ඡන්දදායකයාන්ට නොමිලේ ප්‍රවාහන පහසුකම්සලසා දීමට කටයුතු සූදානම් කර ඇත. මෙම පහසුකම් අවශ්‍ය අයට මාර්තු මස අවසානයට පෙර වවුනියාව දිසාපති කාර්යාලයේ ලියාපදිංචි වන ලෙස දන්වා ඇත. මුලික අයිතිවාසිකම් පිළිබඳ නඩු තීන්දුවකට අනුව රඳවාගැනීමේ කඳවුරු පොලීසිය යටතට පත්කිරීමට කටයුතු කර ඇත මෙම කඳවුරු මිට පෙර පාලනය වූයේ යුධ හමුදාව යටතේය.



26000 කට ආසන්න පාසල සිසුන් සංඛාවක් මෙම කඳවුරුවල සිට පාසල් අධ්‍යාපනය ලබති. නමුත් පවත්නා සීමිත පහසුකම් හමුවේ ඔවුන් මහත් දුෂ්කරතාවන්ට ඔවුන් පත්වී ඇත.

ජනාධිපති කාර්ය සාධන බලකාය තවත් රාජ්‍යනොවන සංවිධාන ගණනාවකට නැවත පදිංචි කරන ලද ප්‍රදේශ වල වැඩකිරීම සඳහා අවස්ථාව ලබාදී ඇත. මෙම සංවිධාන තාවකාලින හා ස්ථිර නිවාස සෑදීමේ කටයුතු වල, ජීවනොපාය මාර්ග සංවර්ධන සහ පෝෂණය ඉහළ නැංවිමේ කටයුතු වල නිරතවී සිටිති. මිට අමතරව ඉන්දියානු මහකොමසාරිස් කාර්යාලය මැණික්ෆාම්හිදි අවතැන්වූ වන්ගේ කවුරු වල රැඳී සිටින ආබාධිත පුද්ගලයින්ගේ සුභ සිද්ධිය සඳහා කෘතිම අවයව (prosthatic fitting) ඒකකයක් ආරම්භ කරන ලදී.

අප ගේ වෙබ් අඩවියට පිවිසෙන්න
http://www.humanitarian-srilanka.org/Knowledge_ Centre/ Publications.php

මානුෂිය සේවායතන සමූහය විසින් ඉදිරිපත් කරනු ලබන **ක්‍ෂණික තතු විමසුම** මගින් මානුෂිය සේවා සහ සංවර්ධන කටයුතුවල නියැලෙන ආයතන සිය සැලසුම් සකස් කිරීමේ දී එක් එක් ප්‍රදේශයේ පවතින තත්ත්වය අවබෝධ කර ගැනීමෙන් එම ප්‍රදේශයේ අවශ්‍යතාවන්ට අනුකූලව මානුෂිය සහ සංවර්ධන කාර්යයන් සැලසුම් කර ගැනීමට ප්‍රයෝජනවත් වන තොරතුරු සැපයීමට අපේක්ෂා කරයි.

එමෙන්ම මෙම **ක්‍ෂණික තතු විමසුම** මගින් අදාල දිස්ත්‍රික්කයන්හි පවතින සාමයට ගොඩනැගීමට හෝ ගැටුම්වලට තුඩුදෙන සංවේදී තොරතුරු නිරාවරණය කරන හෙයින් ආයතනයන්ට එම ප්‍රදේශවල ගැටුම් ඇති නොවන ආකාරයට සහ ගැටුම් අවම කිරිම/සාමකාමී බවට පරාවර්තනය කිරීමට හා සාමය ගොඩනැංවීමට උපරිම අයුරින් දායක විය ආකාරයෙන් කටයුතු කළ හැකිය.

අවදානම් තත්ත්වය තක්සේරු කිරීම මගින් ආයතනයන්ට තම මෙහෙයුම් කටයුතුවල නියැලෙන අතර සිය සේවකයන් ගේ සහ එම ආයතන කටයුතු කරන ප්‍රදේශයේ ජනතාව ගේ ආරක්ෂාව ද තහවුරු කිරීමට හැකියාව ලැබේ.

බාහිර පාර්ශවයන් සලකා බැලීමේ දී (පොදු ජනතාවල ජාත්‍යන්තර ප්‍රජාව) සංදර්භ විශ්ලේෂණය මගින් උද්දේශන සඳහා අවශ්‍යය වන ශ්‍රි ලංකාවේ දිස්ත්‍රික්කයන්හි පවතින තත්ත්වය පිළිබඳව ප්‍රමාණවත් මෙන්ම සමබර තොරතුරු ලබාදෙයි.

මෙම වාර්තාව පිළිබඳව ඔබගේ අදහස් සහ යෝජනා දැනගැනීමට අපි කැමැත්තෙමු. අපගේ ඊ-මේල් ලිපිනය feed-back@cha.lk

**මානුෂීය සේවායතන සමූහය,**
30/81, ලොන්ඩන් පෙදෙස, කොළඹ 7
දුර/ෆැක්ස්: 94-112506855/2598413